# රුහුණ විශ්වවිද්‍යාලය
## 2021/2022 වර්ෂය සඳහා ආපනශාලා පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන කැඳවීම

රුහුණ විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයට 2021/2022 වර්ෂ තුළදී ආහාරපාන සැපයීම සඳහා ***සේවක ආපනශාලා අංක 01*** පවත්වාගෙන යාමට සුදුස්සෙක් තෝරා ගැනීම සඳහා පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් 2021.03.17 දින ප.ව. 2.00 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

**<u>ලංසු පත්‍ර ලබා ගැනීම</u>**

ආපසු නොගෙවන රු. 1000/- ක මුදලක් ලංසු ගාස්තු ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (සාමාන්‍ය පාලන) වෙත ඉදිරිපත් කිරීමෙන් අදාල විස්තර හා ලංසු පත්‍රිකා 2021.03.16 දින ප.ව. 3.00 දක්වා (කාර්යාල වේලාවන්හිදී) ලබාගත හැකිය. විශ්වවිද්‍යාලය තුල ආපනශාලා පවත්වාගෙන යාමට නුසුදුසු බවට විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇති කිසිදු ආයතනයකට හෝ පුද්ගලයකුට ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

**<u>ලංසු භාර ගැනීම</u>**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු "මුල් පිටපත" සහ "අනු පිටපත" වෙන වෙනම ලියුම් කවර දෙකක බහා එම කවරවල උඩ කෙළවරේ **"සේවක ආපනශාලා අංක 01 සඳහා මිල ගණන් කැඳවීම - 2021/202"** යනුවෙන් පැහැදිලිව සඳහන් කර 2021.03.17 වන දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **"සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර"** යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් එම ලිපිනයේ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති අංක: 01 ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලිය හැකිය. ප්‍රමාද වී හෝ අසම්පූර්ණව ලැබෙන ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**<u>ලංසු විවෘත කිරීම</u>**

2021.03.17 වන දින ප.ව. 2.00 ට ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. මේ පිළිබඳව වැඩි විස්තර සඳහා අංක: 041-2222681/82 දිගුව 2180 යන දුරකථන මගින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන ගෙන් විමසා දැන ගත හැකිය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම. මාතර.
2021.03.04